## අතිරේක නීතිරීති

**1. විභාග පැවැත්වීමේ ක්‍රම වේදය**

කැලණිය විශ්වවිද්‍යාලය තීරණය කරනු ලබන පරිදි විද්‍යාර්ථීන් විභාග ශාලාවලට කැඳවා හෝ මාර්ගගත ක්‍රමයට හෝ  විභාග පැවැත්වීම සිදු කරනු ලැබේ.

**2. පාඨමාලා ඒකක ඇගයීම**

සෑම පාඨමාලා ඒකකයක් ම ඇගයීමට ලක් කර ශ්‍රේණි ප්‍රදානය කෙරේ. පාඨමාලා ඒකක ඇගයීම පහත සඳහන් ක්‍රමවලින් එකකට හෝ කිහිපයකට හෝ අනුව සිදු විය හැක.

| | | | |
|---|---|---|---|
| 2.1 | ලිඛිත විභාග (Exmamination) | 2.6 | පැවරුම් (Assignment) |
| 2.2 | මූලාශ්‍රය පරිශීලන විභාග (Open book Exmamination) | 2.7 | මාර්ගගත ප්‍රශ්නාවලිය (Online Quizzes) |
| 2.3 | වාර්තා (Reports) | 2.8 | පංති කාමර පරීක්ෂණ (In class Test) |
| 2.4 | වාචික පරීක්ෂණ (Oral Test) | 2.9 | ප්‍රස්තුතිකරණ (Presentation) |
| 2.5 | අඛණ්ඩ ඇගයීම් (Continuous Assessment) | 2.10 | ආයතනික පුහුණු (Internship/Work-based training) |

**3. එක් විෂයක් සඳහා ලියාදිංචිය ලබා දෙන උපරිම සීමාව හා අවම සීමාව**

අධ්‍යයන වර්ෂයට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 25% ක උපරිමයකට යටත්ව එක් විෂයයක් සඳහා ලියාදිංචිය ලබා දෙන අතර අවම වශයෙන් අයදුම්කරුවන්  20 දෙනෙකුවත් නොමැති විෂයයන් සඳහා ලියා පදිංචිය සිදු කරනු නොලැබේ. එබැවින් මෙම හේතුව නිසා ලියාපදිංචිය ප්‍රතික්ෂේප වන අයදුම්කරුවන්ට වෙනත් විෂයන් ඉල්ලීම සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.

**4. ලියාපදිංචි විෂය හෝ භාෂා මාධ්‍ය සංශෝධන කිරිම**

ලියාපදිංචි විෂයයන් මාරු කිරීමට හෝ භාෂා මාධ්‍ය වෙනස් කිරීමට සෑම අපේක්ෂකයෙකුට ම එක් අවස්ථාවක් ලැබෙන අතර එය ආයතනයේ ලියා පදිංචිය අවසන් වූ දිනයේ සිට මාසයක් ඇතුලත සිදුකර ගත යුතුවේ. ඉන් පසු කුමන හෝ හේතුවක් මත විෂය හෝ භාෂා මාධ්‍ය වෙනස් කළ නොහැක.

**5. විභාගයට පෙනී නොසිටීම**

සෑම විද්‍යාර්ථියෙකුම ලියාපදිංචි වන සියලුම පාඨමාලා ඒකක සඳහා අනිවාර්යන්ම විභාගයට පෙනී සිටිය යුතුය. කිසියම් පාඨමාලා ඒකකයකට පෙනී නොසිටීම පිළිබඳව විශ්වවිද්‍යාලයීය අභියාචනා මණ්ඩලයට පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකර විභාගයට පෙනී නොසිටියහොත් අදාළ විභාගයට **නොපැමිණි** (ab) වශයෙන් සඳහන් කරනු ඇත.

**6. අභියාචනා ඉදිරිපත් කිරීම**

නොවැළැක්විය හැකි හේතුවක් නිසා ප්‍රථම වරට විභාගයට පෙනී සිටීමට නොහැකි වූ සිසුන්ට අභියාචනා ඉදිරිපත් කිරීම මගින් **ප්‍රථම වරට පෙනී සිටින අපේක්ෂකයෙකු** ලෙස අදාළ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ඇත. ඒ සඳහා අභියාචනා කමිටුවට පිළිගත හැකි හේතු පැහැදිලි කරමින් ලිපියක් ඉදිරිපත් කර එම කමිටුවෙහි නිර්දේශය ලබාගත යුතුය. **අසමත් වූ විෂය ඒකක සඳහා මෙය වලංගු නොවේ.**

**7. අසමත් වූ විෂයයන් සඳහා නැවත පෙනී සිටීම**

කිසියම් පාඨමාලා ඒකකයට C ශ්‍රේණියට පහළ අසමත් ශ්‍රේණි (C-/D+/D/E) ලබා ගත් විද්‍යාර්ථියෙකුට උපරිම වශයෙන් C ශ්‍රේණියක් ලබා ගැනීම සඳහා නැවත විභාගයට පෙනී සිටිය හැකිය. මෙහි දී විද්‍යාර්ථියා ලබා ගත් ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක් ලබා ගත හොත් කලින් තිබූ ශ්‍රේණිය ම උපාධියට ගණනය කරනු ලැබේ.

**8. නැවත පෙනී සිටින සිසුන්ගේ පැවරුම් හා ප්‍රායෝගික පරීක්ෂණ**

නැවත විභාගවලට පෙනී සිටින අපේක්ෂකයෙකු අදාළ ප්‍රශ්න පත්‍රයේ කොටසක් ලෙස පැවරුම් හෝ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා පෙනී සිටිය යුතු අවස්ථාවල දී නැවත ඒ සඳහා පැවරුම් ඉදිරිපත් කිරීමට හෝ ප්‍රායෝගික පරීක්ෂණවලට පෙනී සිටීමට අවශ්‍ය නොවන අතර මුල් වතාවේ ලබා ඇති ලකුණු ඒ සඳහා අදාළ කර ගැනීමට හිමිකම් ලැබෙනු ඇත.

**9. උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන කාලය**

අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 5ක් ඇතුළත උපාධිය සම්පූර්ණ කළ යුතු අතර පන්ති සාමාර්ථ ලබා ගැනීමේ දී එය අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3 ක් විය යුතුය. එසේ වුව ද අධ්‍යයන වර්ෂ 10 ක උපරිමයකට යටත්ව අසමත් පාඨමාලා ඒකක සම්පූර්ණ කර ගැනීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථා ඇත.

**10. පාඨමාලා ඒකක විභාග ප්‍රතිඵල නිකුත් කිරීම**

එක් එක් වර්ෂවල දී පැවැත්වෙන පරීක්ෂණවලට අදාළ සියලු පාඨමාලා ඒකකවලට අදාළ ප්‍රතිඵල නිකුත් වීමෙන් අනතුරුව විභාග ප්‍රතිඵල සටහනක් අන්තර්ජාලය ඔස්සේ cdce වෙබ් පිටුවේ ප්‍රදර්ශනය කරනු ඇත.

**11. උපාධි පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල නිකුත් කිරිම**

උපාධි පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ අදාළ වර්ෂ තුන ඉකුත් වීමෙන් පසු සියලුම වර්ෂවල (ස්තර තුනේම/හතරේම) ප්‍රතිඵල සලකා බලා අවසන් ප්‍රතිඵල ගණනය කොට විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ කමිටුවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුවය.

**12. ශ්‍රේණි ලකුණු සාමාන්‍ය (GPA) සකස් කිරීම හා නිකුත් කිරීම**

එක් එක් වර්ෂවල දී පැවැත්වෙන පරීක්ෂණවලට අදාළව ශ්‍රේණි ලකුණු සාමාන්‍යය සකස් කිරීමක් සිදු නොවන අතර අදාළ වර්ෂ තුන ඉකුත් වීමෙන් පසු උපාධි පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල ගණනය කිරීමේ දී පමණක් ශ්‍රේණි ලකුණු සාමාන්‍ය සකස් කොට ප්‍රතිඵල ලේඛනයේ සඳහන් කෙරේ. එබැවින් අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රථම ශ්‍රේණි ලකුණු සාමාන්‍ය ලබා ගැනීමට විද්‍යාර්ථීන්ට හැකියාවක් නැත.

**13. සහතික නිකුත් කිරීම**

ලියාපදිංචි වීමෙන් පසු ප්‍රථම/දෙවන/තෙවන වසර තුළ දී විද්‍යාර්ථීන්ට අත්‍යවශ්‍ය කාරණයකට ඉල්ලීමක් කළ පසු අධ්‍යයන වාර්තාවක් (Partial Grade Report) මුදල් ගෙවා ලබා ගත හැක. අවසන් ප්‍රතිඵල නිකුත් කොට සනාතන සභාවේ අනුමැතියෙන් පසු ලබා දෙන විස්තර සහිත අධ්‍යයන සහතිකය (Academic Record) උපාධිය සමත්වන සෑම විද්‍යාර්ථියෙකු සඳහාම ආයතනය මගින් නිකුත් කරන අතර එහි අතිරේක සහතික අවශ්‍යය නම් මුදල් ගෙවා ලබා ගත යුතුය. උසස් අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍යතාවය මත ලබා දෙන ලකුණු විස්තර සහිත රහස්‍ය අධ්‍යයන වාර්තාව (Academic Transcrpt) එම ආයතනයේ ලිපිය සමග විද්‍යාර්ථීන් විසින් ඉල්ලුම් කොට මුදල් ගෙවූ පසු එම ආයතනයට ලැබීමට සලසුවනු ඇත.

**14. උපාධි සහතික නිතුත් කිරීම**

උපාධි ප්‍රදානෝත්සවයෙන් අනතුරුව නියම කර ගන්නා දිනයන්හී කැලණිය විශ්වවිද්‍යාලය මගින් උපාධි සහතික නිකුත් කරනු ලැබේ.